## ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය

## කාර්ය මණ්ඩල පුරප්පාඩු

**රියදුරු**

**කේතය** - DV **තනතුරු ගණන** – 06

**සමස්ථ වේතන** (වැටුප් පරිමාණය PL 3 - රු.26,290– 10 x 270 – 10 x 300 – 10 x 330- 12 x 350 – 39,490 - 02/2016).

- අදාළ චක්‍රලේඛවලට අනුව මූලික වැටුප, ජීවන වියදම් දීමනාව, මාසික දීමනාව, අතුරු දීමනාව සහ ප්‍රවාහන දීමනාව ඇතුළත්ව මුළු මාසික වැටුප දළ වශයෙන් රු. 82,622.50 වේ.
- වෙනත් ප්‍රතිලාභ - සෞඛ්‍ය රක්ෂණ යෝජනා ක්‍රමය, හදිසි අනතුරු රක්ෂණ ක්‍රමය, මරණ ප්‍රතිපාදන යෝජනා ක්‍රමය, ප්‍රසාද දීමනා

**සුදුසුකම් සහ පළපුරුද්ද**

අවම වශයෙන් වාර දෙකකදී අ.පො.ස. (සා.පෙ.) හි විෂයයන් හයක් (06) සම්මාන සාමාර්ථ දෙකක් සහිතව සමත් වීම:

සහ

මෝටර් රථ දෙපාර්තමේන්තුවේ කොමසාරිස් ජෙනරාල් විසින් නිකුත් කරනලද වාහන නව කාණ්ඩය යටතේ A1, A, B1, B, C1, C, D සහ D යන කාණ්ඩවල හෝ පැරණි කාණ්ඩය යටතේ A, A1, B, B1, C, C1, D, E, F යන කාණ්ඩවල රියදුරු බලපත්‍රයක් තිබීම හා රිය අනතුරක් හෝ දඩුවමක් හෝ සම්බන්ධයෙන් සටහනක් නොමැතිව රියදුරු බලපත්‍රය ලබා ගැනීමෙන් පසු රිය පැදවීමේ අවම වශයෙන් අවුරුදු තුනක (03) පළපුරුද්ද තිබීම;

සහ

රාජ්‍ය ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක රියදුරෙකු ලෙස රියදුරු බලපත්‍රය ලබා ගැනීමෙන් පසු අවම වශයෙන් අවුරුදු පහක (05) පළපුරුද්දක් තිබීම;

සහ

අයදුම් කළ දින සිට දින තිහක් (30) ඇතුළත වූ ලියාපදිංචි වෛද්‍යවරයකු විසින් ශාරීරික යෝග්‍යතාව (වර්ණ අන්ධතාවයෙන් තොර ඇස් දෙකෙහිම දෘශ්ටිය 6/6 යන්න ඇතුළුව) සහතික කරන ලද වෛද්‍ය සහතිකය

- අපේක්ෂකයින් අවුරුදු 18 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය
- වැඩි විස්තර සඳහා සම්මත අයදුම්පත මෙතනින් බාගත හැකිය.
- අයදුම්පත් සමඟ තනතුරු සඳහා ඔබේ සුදුසුකම් සනාථ කිරීම සඳහා සුදුසුකම් සහ පළපුරුද්ද සඳහා ලේඛන සාක්ෂි පිටපත් යැවිය යුතුය.
- සම්මත අයදුම්පත අනුව එවන ලද අයදුම්පත් පමණක් පිළිගන්න අතර ඕනෑම රජයේ ආයතනයක සේවය කරන අයදුම්කරුවන් ආයතන ප්‍රධානියා හරහා ඉල්ලුම් කළ යුතුය.
- නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත් ලියාපදිංචි තැපෑල යටතේ 2023.06.20 දිනට හෝ ඊට පෙර මෙම කාර්යාලයට එවිය යුතු අතර employment@caa.lk යන විද්‍යුත් ලිපිනයටද යොමු කල හැක.
- අයදුම්පත් සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජනරාල් සහ ප්‍රධාන විධායක නිලධාරී, ශ්‍රී ලංකාවේ සිවිල් ගුවන් සේවා අධිකාරිය, අංක 152/1, මිනුවන්ගොඩ පාර, කටුනායක වෙත යොමු කළ යුතු අතර අයදුම් කරන තනතුරේ මාතෘකාව ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ සලකුණු කළ යුතුය.
- සම්මුඛ පරීක්ෂණ / පරීක්ෂණ සඳහා කැඳවනු ලබන්නේ සුදුසුකම් නිර්ණායකයන් සපුරාලන අපේක්ෂකයින් පමණි.

සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජනරාල් සහ ප්‍රධාන විධායක නිලධාරී
ශ්‍රී ලංකාවේ සිවිල් ගුවන් සේවා අධිකාරිය,
අංක 152/1,
මිනුවන්ගොඩ පාර,
කටුනායක.
2023.06.13